සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

# සිංහල භාෂාව හා සාහිත්‍යය

7 ශ්‍රේණිය — කාලය පැය 02 යි

| නම/ විභාග අංකය: |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 හා 02 ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

01 පාරේ සිටි ........................................................ (කාන්තාවක / කාන්තාවක්) බස්රියට ගොඩ වූවා ය.

02 දිසාපාමොක් .................................................... (ආචාරීහු / ආචාරීන්) මිදුලෙහි සක්මන් කොට සිටියා හ.

- අංක 03, 04 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

03 (i) ප්‍රස්ථාරය (ii) කොට්ඨාශය (iii) ශිෂ්ඨාචාරය (iv) කණගාටුව

04 (i) දුම්රියපොළ (ii) ආභාශය (iii) පළතුරු (iv) පරිණාමය

- අංක 05 සිට 10 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

05 අවසාන ක්‍රියාවක් වන්නේ,

(i) ගොස් (ii) බලමින් (iii) බලයි (iv) පැන පැන

06 දී ඇති වාක්‍යාංශයට ගැළපෙන තනි පදය තෝරන්න.

යමෙකු හෝ යමක් සිහිපත් කිරීම

(i) ස්වෛරී (ii) පසුතැවිල්ල (iii) ගෝරනාඩුව (iv) අනුස්මරණය

07 ප්‍රථම පුරුෂ බහු වචන නාම පදය

(i) තොපි (ii) ගෙවිලියෝ (iii) අපි (iv) නුඹලා

08 ඒක වචන අනුක්ත නාම පදයක් නොවන්නේ,

(i) මිනිසුන් (ii) මා (iii) තා (iv) අප

09 කමත් භාෂාවේ 'පැගිරි බෝය' යන යෙදුම සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන පදය වන්නේ,

(i) කෝපි (ii) උදේ ආහාරය (iii) බුලත්විට (iv) ආප්ප

10 උපසර්ගයක් යෙදී නැති පිළිතුර තෝරන්න.

(i) අභිමානය (ii) අකුසල් (iii) නිවහල් (iv) සුන්දර



EXAMRESULTS.LK

- **අංක 11 සහ 12 ප්‍රශ්නවල දී ඇති වාක්‍යවල හිස්තැනට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11 දුටුගැමුණු රජතුමා ................................................ (යෝධයන් / යෝධයෝ) සමග සටනට ගියේ ය.

12 ................................................................................ (ගොවීහු / ගොවියන්) ශ්‍රී ලංකාව සහලින් පෝෂණය කරති.

- **අංක 13 සහ 14 ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථ දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

13 යහගුණ - (අගුණ / දෙගුණ / අවගුණ)

14 ජාතික - (සහජාතික / අවජාතික / විජාතික)

15 'සාගරය' යන්නට සමානාර්ථ පද 2 ක් ලියන්න.

සාගරය - ...................................................... ..........................................................

- **අංක 16 සහ 17 ප්‍රශ්නවල ඉරි ඇඳි පද අයත් ක්‍රියාපද වර්ගය තෝරා යටින් ඉරක් අඳින්න.**

16 අක්කා පොත <u>කියවා</u> පාඩම පැහැදිලි කළා ය.

( අවසාන ක්‍රියා / මිශ්‍ර ක්‍රියා / පූර්ව ක්‍රියා )

17 ළමයා <u>හඬ හඬා</u> පාර දිගේ යයි.

( මිශ්‍ර කියා / අවසාන ක්‍රියා / පූර්ව ක්‍රියා )

18 දී ඇති පදවල අනුක්ත පද ලියන්න.

(i) කුමාරයෝ

(ii) ඕ තොමෝ

19 ''පෙරළි පෙරළි සෙල්ලම් කොට'' කවි පදයෙහි ඇතුළත් කාව්‍ය උපක්‍රමය වන්නේ,

(i) එළිසමය (ii) අනුප්‍රාසය (iii) රූපක (iv) උපමා

20 කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.

මගෙ සුරතල් අක්කාගේ

මාලේ මුතු ඇට වාගේ

............................................................................

............................................................................

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමු, දෙවන හා තෙවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01 (i) සිට (v) කොටස තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) මිශ්‍ර සිංහල හෝඩියේ සඤ්ඤක අක්ෂර ගණන කීයද? ඒවා ලියා දක්වන්න.

(ii) තිලමුට්ඨි ජාතකයෙන් ගතහැකි යහපත් ජීවිතාදර්ශයක් ලියන්න.

(iii) මිනිසා මුලින් ම භාවිතා කළ ලෝහ වර්ග 2 ක නම් ලියන්න.

(iv) මේ වචනවල අරුත් පැහැදිලි කර ලියන්න.

1. වහන් සඟළක් ..............................

2. පාටව කෙරෙමි ..............................

(v) කවියේ ඉතිරි පද ලියා කවිය සම්පූර්ණ කරන්න.

කෙසෙල් ගසින් මතු වෙලා

ගොබය වටින් දූවටිලා

..............................

.............................. (ලකුණු 2 x 5 = 10)

02 පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන රචනයක් ලියන්න.

(අ) දෙමවුපියන්ගේ අගය.

(ආ) අපෙන් පාසලට ඉටුවිය යුතු යුතුකම්.

(ඉ) වන අසිරිය රැක ගනිමු.

(ඊ) ජන කවිය සුරකිමු. (ලකුණු 20)

03 ඔබේ පාසලේ වර්ෂ අවසානයේ පැවැත්වෙන 'ත්‍යාග ප්‍රදානෝත්සවය' ට සහභාගි වන ලෙස ඉල්ලමින් ආරාධිතයන් වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රය නිර්මාණාත්මකව සකස් කරන්න. (ලකුණු 10 යි.)

04 පහත වාක්‍යයවල වැරදි නිවැරදි කර ලියන්න.

(i) කාන්තාවක් දරුවෙක් වඩාගෙන බස්රියට නැංගා ය.

(ii) ආචාරීන් වහන්සේ කුමාරයාට කරුණු පැහැදිලි කළේ ය.

(iii) හවසට නෙළුම් මල් පරවෙති.

(iv) නුඹ පාසලට පැමිණියහු ද?

(v) තුරුලතාවෝ වර්ෂාවෙන් පණ ලබයි. (ලකුණු 2 x 5 = 10)

05 පහත සඳහන් උද්ධෘත ඇසුරෙන් වගුව සම්පූර්ණ කරන්න.

(i) මා ඇස් හමුයේ මොහුගේ රාජ්‍යශ්‍රීය දකිමි.

(ii) "අපි නැහුණා ! අපි නැහුණා දුවමු, දුවමු"

(iii) "උපාසක මහත්තයෝ, අද බෝධි පූජාවේ ප්‍රධාන දායක තැන කවුද?"

(iv) අන්න මොකක් ද කියනවා ඇහෙනවා. සද්ද නැතිව ඉන්නකෝ, ඒක අහගන්න.

(v) "අපි ගිහින් එන්නම් රාලහාමි. තව ටිකකින් කළු ගඟුල එවන්නම්"

| | පාඩමේ නම | කීවේ කවුද? | කීවේ කාහටද? |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |
| (iv) | | | |
| (v) | | | |

(පාඩමේ නම සඳහා ලකුණු 01) ඉතිරි කොටස් සඳහා ½ බැගින් ලකුණු 01

(ලකුණු 2 x 5 = 10)

06 කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

කලා වැවේ මහ ජල තල පිසගෙන
හමා බසින සුළඟින් ජීවය ගෙන
හැරෙව් යෝද පිළිමය දෙස අවුකන
වැටෙව් එතැන සිරිපා මුල දණ ඇන

පොළොන්නරුවෙ ගල් පිළිමය අතරින්
වරම් ලබා මහ පැරකුම් රජුගෙන්
නැගෙව් පේළියට සමනොල සිරසට
බලව් අවට පහළින් ඇති දෙරණත

(i) කවි පෙළෙන් කියවෙන බුදු පිළිම මොනවා ද?

(ii) ජීවය ලබා ගන්නට කියන්නේ මොනවායින් ද?

(iii) වරම් ලබා ගත යුත්තේ කාගෙන් ද?

(iv) මෙහි කියවෙන කඳු මුදුන කුමක් ද?

(v) මේ වචනවල අර්ථ ලියන්න.

සිරස - දෙරණ -

(ලකුණු 2 x 5 = 10)